ට්‍රාන්ස්පේරන්සි ඉන්ටනැෂනල් ශ්‍රී ලංකා

**ජාතික සුපිළිපන් ප්‍රණාම - 2009 (විශේෂ සඳහන් කිරීම)**

**අයිරාංගනී ද සිල්වා මහත්මිය**

ශ්‍රී ලංකා සත්ත්ව සුභ සාධන භාරයේ සභාපතිනි අයිරාංගනී ද සිල්වා මහත්මිය, ශ්‍රී ලංකාවේ සත්ත්ව හිංසනය සිදුවන ආකාර පිළිබඳව අධ්‍යයනය කරමින් ඒ හා බැඳී ඇති විවිධාකාර ගැටළු හඳුනාගෙන, පද්ධතිමය වෙනස්කම් ඇති කිරීම ඔස්සේ එම ගැටලුවලට විසඳුම් සෙවීමට පුරෝගාමී මෙහෙවරක නිරතව සිටින කාන්තාවකි.

දෙහිවල ශුද්ධ වූ පවුලේ කන්‍යාරාමයේ හා කොටහේනේ යහපත් එඬේරාගේ කන්‍යාරාමයෙන් අධ්‍යාපනය හදරා රාජ්‍ය ආයතන කිහිපයක විවිධ තනතුරු හොබවා ඇති අයිරාංගනී මහත්මිය දශක කිහිපයක සිටම ශ්‍රී ලංකාවේ මහා පරිමාණයෙන් සිදුවන නීති විරෝධී ගව ජාවාරම් හා වන සත්ත්ව ඝාතන ආශ්‍රිතව සිදුවන දූෂණ හා අක්‍රමිකතා සම්බන්ධයෙන් ක්‍රියාකාරීව විරෝධය පළ කර තිබේ.

එම නීති විරෝධී ජාවාරම හා බැඳී ඇති දේශපාලන බලවතුන්, රාජ්‍ය නිලධාරීන් හා කූට ජාවාරම්කරුවන් ඇතුලත් දූෂිත ජාලය හඳුනාගනිමින්, මෙම ජාවාරමේදී ඔවුන් රිංගා යන සිදුරු ඇහිරීම සඳහා ශක්තිමත් නෛතික රාමුවක් ඇතිකරගැනීම වෙනුවෙන් වෙහෙසෙන ඇය යල්පැනගිය සත්ත්ව නීති හා සත්ත්ව හිංසා ආඥා පනතේ අඩුපාඩු පෙන්වා දෙමින් එම පනත් සඳහා නව සංශෝධන ඉදිරිපත් කිරීමට සමත්විය. 1958 සත්ව නීතිය හා 1980 ගෝ ඝාතන ආඥා පනතට නව සංශෝධන ඇතුලත් කරමින් 2009 වසරේ ගෙනඑන ලද සංශෝධන පනත් කෙටුම්පත අයිරාංගනී ද සිල්වා මහත්මියගේ දැඩි පරිශ්‍රමයක ප්‍රතිඵලයකි.

මෙම නීතිය හඳුන්වාදීමෙන් පසු ඇය අදළ නිලධාරීන් දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කළාය.නව නීතිය ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා සුදුසු ආකෘතියක් සකස් කර එය අදළ පොලිස් ස්ථානවලට බෙදහැරීමටද අයිරාංගනී මහත්මියගේ මූලික විය.

"ලංකාව වගේ රටක සත්ත්ව නීති, සත්ත්ව හිංසන වැලැක්වීමේ නීති ක්‍රියාවට නැංවීම පහසු නෑ. දේශපාලනඥයින් එවැනි දේවල් ගැන යන්තම්වත් සංවේදී නෑ. අවුරුදු හතක් තිස්සේ අපි දැඩි පරිශ්‍රමයක් දරලා, නීති කොමිෂන් සභාවේ නිලධාරීන් එක්ක වාද විවාද කරලා පාස්කරලා යවපු සත්ත්ව සුබසාධන පනත තවම පාර්ලිමේන්තුවේ හිරවී තිබෙනවා"

සත්ත්ව සුබසාධන ක්ෂේත්‍රයේ පවත්නා දූෂණ පිළිබඳව මනා අවබෝධයක් ඇති ඇය ඒවා මැඩීම තුළින් යම් දුරකට හෝ යහපාලනයක් ඇතිකරගත හැකි බව සපළ කර සිටියි.

නීති විරෝධී ගව ජාවාරම් සම්බන්ධයෙන් වැරදිකරුවන් වන අයට ඉතා අවම දඬුවම් හිමිවීම, සොරකම් කරන ලද සතුන් නැවත චූදිතයාටම හිමිවීම ආදී නීතියේ පවත්නා හිඩැස් හා ඒ හා බැඳී ඇති දූෂිත ජාලයන් සමග තදින් ගැටුන අයිරාංගනී මහත්මිය ඒ පිළිබඳව අදළ බලධාරීන්ගේ අවධානය යොමුකරවමින්, ඒ සම්බන්ධ අධිකරණ ක්‍රියාවලියට පොලීසියට සහය වෙමින් දැනට නඩු 30 කට අධික සංඛ්‍යාවක් පවත්වාගෙන යයි. එසේම කිසිදු නීතිමය පදනමකින් තොරව පින්නවල අලි අනාථාගාරයේ කුඩා අලි පැටවුන් දෙදෙනෙකු දළද ාමාලිගාවට ලබාදීම සමඟ මතුවූ යහපාලනය පිළිබඳ ගැටලුමය ඍජුව මැදිහත් වූ ඇය ඊට එරෙහිව අධිකරණයේ පිහිට පැතුවාය.

සත්ව හිංසනය හා ඝාතන සම්බන්ධයෙන් මෙරට පද්ධතියේ පවත්නා අඩුපාඩු හඳුනාගනිමින්, එම නීති පද්ධතිය සවිබල ගැන්වීම පිණිස අයිරාංගනීද සිල්වා මහත්මිය තවදුරටත් කැපවී සිටී.